# පර්යේෂණ ආචාරධර්ම

- මිනුවන්ගොඩ ඤාණාවාස හිමි

**ප්‍රවේශය**

පර්යේෂණයක් යනු නව තොරතුරු සොයා ගැනීමට හෝ පවත්නා දැනුම පුළුල් කිරීම සඳහා විද්‍යාත්මක වූත් සැලසුම් සහගත වූත් ප්‍රවේශයකින් සිදු කරනු ලබන අධ්‍යයනයකි. එය අතිශය දීර්ඝ විමසීමක් හෝ විභාගයක් ලෙස හැඳින්වේ. එසේම එය නව සොයාගැනීම් අරමුණු කරගත් ගවේෂණයක් හෝ අත්හදා බැලීමක් මෙන්ම කරුණු අර්ථකථනය කිරීමක්ද විය හැකිය. එය දැනට පිළිගත් න්‍යායන්ගේ සංශෝධනයක් ද විය හැකිය. නැතහොත් දැනට පිළිගත් න්‍යාය හෝ රීති සඳහා ප්‍රායෝගික නව මුහුණුවරක් ලබා දීමද විය හැකිය (Webster Dic.2018). ඒ අනුව සමස්තයක් ලෙස පර්යේෂණයක මුඛ්‍ය පරමාර්ථය වන්නේ මිනිස් සමාජයේ උන්නතියයි. එබැවින් මිනිසාගේ යහපත උදෙසා සිදු කරන පර්යේෂණයක් මිනිසාගේ අයිතිවාසිකම් හා ඔහුගේ සුභසාධනය උල්ලංඝනය නොවන අයුරින් හා කිසිවෙකුට හානි නොවන අයුරින් සිදු කළ යුතුය. ඒ සඳහා පර්යේෂකයා විසින් අනුගමනය කළ යුතු කොන්දේසි සහ ආචාර ධර්ම සමුදායකි. එම කොන්දේසි සහ ආචාර ධර්ම සමුදාය පර්යේෂණ ආචාර ධර්ම ලෙස පොදුවේ හැඳින්විය හැකිය. පර්යේෂණයක ගැටලුව හඳුනා ගැනීමේ සිට පර්යේෂණ පත්‍රිකාව එළිදැක්වීම දක්වා වන සමස්ත පර්යේෂණ ක්‍රියාවලිය සඳහා මෙම ආචාර ධර්ම වලංගු වේ. කෙසේ වෙතත් ආධුනික බව, නොදැනුවත් බව සහ නොසලකා හැරීම වැනි සාධක නිසා බොහෝ පර්යේෂකයන් පර්යේෂණ ආචාර ධර්මවලට එකඟ නොවන අයුරින් සිය පර්යේෂණ කාර්යයේ නිරත වීම සුලබව දක්නට ලැබේ. එබැවින් ඒ ඒ පර්යේෂණ කාර්යය තුළ භාවිත කළ යුතු පර්යේෂණ ආචාරධර්ම සහ ඒවායේ අදාළත්වය මෙම පරිච්ඡේදයේදී සාකච්ඡාවට ලක් කෙරේ. එහිදී පර්යේෂණ ආචාරධර්මවල වැදගත්කම, පර්යේෂණ මාතෘකාවක් තෝරා ගැනීමේදී අනුගමනය කළ යුතු ආචාර ධර්ම, පර්යේෂණ කාර්යය අතරතුර අනුගමනය කළ යුතු ආචාර ධර්ම සහ පර්යේෂණ කාර්යය නිම කිරීමෙන් අනතුරුව සලකා බැලිය යුතු ආචාර ධර්ම යන ශීර්ෂ යටතේ එම කරුණු ඉදිරිපත් කෙරේ.

## 01. පර්යේෂණ ආචාරධර්මවල වැදගත්කම

බොහෝ දෙනා ආචාරධර්ම පුරුදු පුහුණු වන්නේ තම නිවස, පාසල, සමාජය හා ආගමික ස්ථාන ඇසුරු කර ගනිමින්ය. කුමක් නිවැරදි ද? කුමක් වැරදි ද? යන පොදු හැඟීම් සමුදාය ආචාර ධර්ම ලෙස සරලව හැඳින්විය හැකිය. ඕනෑම සමාජයක ඊට අනන්‍ය වූ ආචාර ධර්ම පද්ධතියක් පවතියි. කෙසේ වෙතත් අන්තර් සමාජීය වශයෙන්, හොඳ නරක විනිශ්චය විවිධ වන අතර එකම සමාජයක වුවද ඒ ඒ ආචාර ධර්ම පිළිබඳව විවිධ පිළිගැනීම්, නොපිළිගැනීම් මත පවතින මතභේද පැවැතිය හැකිය. කෙසේවෙතත් මෙම ආචාර ධර්ම සාමාන්‍ය සමාජයක පැවැත්ම තහවුරු කරයි. ආචාර ධර්ම මගින් පුද්ගල හැසිරීම පාලනය කිරීමක් සිදුවන අතර එකී කර්තව්‍යමය සම්මත නීති මගින් ද සිදු කෙරෙයි. එහෙත් පොදු නීතිය සහ ආචාර ධර්ම එකිනෙකට සමාන නොවේ. ආචාර ධර්ම නීතිවලට වඩා පුළුල් වන අතර නීතිය මෙන් විධිමත් ආකෘතියකින් ඉදිරිපත් නොවේ. ඇතැම් නීත්‍යානුකූල ක්‍රියා ආචාර ධර්මවලට පටහැණි විය හැකි අතර, ඇතැම් ආචාර ධර්ම නීත්‍යානුකූල නොවිය හැකිය.

සමාජයයේ පවතින පොදු ආචාරධර්ම පද්ධතියට අමතරව, එක් එක් පන්තියට, ආයතනවලට හා විෂය ක්ෂේත්‍රයන්ට අයත් ආචාර ධර්ම පද්ධති පවතියි. උදාහරණ ලෙස වෛද්‍ය වෘත්තියට අදාළව වෙනම ආචාර ධර්ම පද්ධතියක් ගුරු වෘත්තියට අදාළව වෙනම ආචාර ධර්ම පද්ධතියක් ඇත. මෙම ආචාරධර්ම මගින් ඒ ඒ අංශයන් කෙරෙහි මහජන විශ්වාසය තහවුරු කිරීම සහ එම අංශවලට අදාළ පුද්ගලයන්ගේ හැසිරීම පාලනය කිරීම සිදු කෙරෙයි. මේ අනුව, පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළව පර්යේෂකයන් අතර සම්මත කරගත් ආචාර ධර්ම පද්ධතියක් පවතියි.

පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළව ආචාරධර්ම පද්ධතියක් පැවැතීම මගින් පර්යේෂණවල ගුණාත්මක බව සහ විශ්වසනීයත්වය ඉහළ නැංවෙයි. පර්යේෂණ ආචාරධර්ම පර්යේෂණ මගින් හෙළි කරන නව දැනුම් කොටස්වල නිරවද්‍යභාවය සහ සත්‍යවාදී බව ඉහළ නංවන අතර පර්යේෂණ ගැටලු අවම (Error) කිරීමට දායක වෙයි. උදාහරණයක් වශයෙන් පර්යේෂණ ආචාරධර්ම මගින් පර්යේෂකයාට

ප්‍රබන්ධ ගෙතීම (Fabricating), අසත්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම (Falsify) සහ වැරදි ලෙස දත්ත අර්ථකතනය කිරීම (Misintepritation of Research Data) ආදිය සිදු කිරීමේ ඇති හැකියාව අවම කරයි (Resnik, 2015: 26).

පර්යේෂණයක් සිදු කිරීම යනු එක් පසකින් ඉතා පුළුල් පරාසයකට විහිදුණු සන්නිවේදන කාර්යයකි. එහිදී, විවිධ පුද්ගලයන් සමඟ සහයෝගීතාව අපේක්ෂා කෙරෙයි. විවිධ පුද්ගලයන් සහ ආයතන සමඟ සහ සම්බන්ධතාවේදී අත්‍යවශ්‍ය විශ්වසනීයතාව, වගවීම, අන්‍යෝන්‍ය ගෞරවය, රහස්‍යභාවය සහ සාධාරණත්වය වැනි වටිනාකම් (Values) ආරක්ෂා වීම සඳහා ඇති එකම විකල්පය වන්නේ පර්යේෂණ ආචාර ධර්මයි. පර්යේෂණ ආචාරධර්ම පද්ධතියක් පැවතීමේ තවත් වැදගත්කමක් වන්නේ එමගින් පර්යේෂකයා මහජනයාහට වගකීමට යටත් වීමයි. ආචාරධර්මවල ඇති වලංගුතාව මත ඇතිවන විශ්වාසය නිසා පර්යේෂකයාට අවශ්‍ය මහජන සහයෝගය ලබා ගැනීම පහසු වෙයි (Folkman. 2015: 226).

පර්යේෂණ ආචාරධර්ම පර්යේෂණ ක්ෂේත්‍රයට පමණක් නොව සාමාන්‍ය සමාජ ප්‍රගමනයට ද හේතු වෙයි. ඒවා මගින් සමාජ වගකීම, (Social Responsibility) වගවීම (Accountability) වැනි ගුණාංග තහවුරු වන අතර එය මානව හිමිකම් ඉහළ නැංවීමට ද හේතු වෙයි. නීතිගරුක බව, මානව සමාජයේ මෙන් ම සත්ව හා ශාකවල ආරක්ෂාව සහ යහපැවැත්ම තහවුරු වෙයි. සමස්තයක් ලෙස පර්යේෂණයක මූලික අරමුණ වන්නේ එම පර්යේෂණය මගින් මිනිසාගේ සුබ සිද්ධියට මෙන් ම විද්‍යාවට ද යම් කිසි සේවයක් සිදු කිරීමය (සේනාධීර සහ වනසිංහ, 2013 : 210). ඒ අනුව ආචාර ධර්මවලින් බැහැරව පර්යේෂණයක් සිදු කිරීම අසම්මතයකි.

පර්යේෂණ සම්බන්ධව විවිධ රාජ්‍ය ආයතන, වෘත්තීය සංවිධාන සහ විශ්වවිද්‍යාල එකිනෙකට විශේෂ වූ පර්යේෂණ ආචාර ධර්ම හඳුන්වා දී තිබේ. ඒ අතර සෑම පර්යේෂණ ක්ෂෙත්‍රයකටම පොදු වූ සහ සෑම ආයතනයක් විසින්ම පොදුවේ පිළිගන්නා ලද පර්යේෂණ ආචාර ධර්ම සමුදායකි.

## 2. මාතෘකාවක් තෝරා ගැනීමේදී අනුගමනය කළ යුතු පර්යේෂණ ආචාරධර්ම

පර්යේෂණයට සුදුසු මාතෘකාවක් තෝරා ගැනීමේදී හුදෙක් තම ශාස්ත්‍රීය හෝ වෘත්තීය ප්‍රගමනය පමණක් සලකා ක්‍රියා නොකළ යුතුය. (Hesse, Biber and Leary, 2006). එහිදී මානව සමාජයේ, පර්යේෂණ ක්ෂේත්‍රයේ සහ අධ්‍යයන ක්ෂේත්‍රයේ උන්නතිය සලකා බැලීම මූලික විය යුතුය. එහිලා නොවටිනා පර්යේෂණ සහ පූර්ව පර්යේෂණ පිටපත් කිරීමේ අභිප්‍රායෙන් වියුක්තව ක්‍රියා කිරීම සත්‍යවාදී පර්යේෂකයාගේ ලක්ෂණයකි. තමාගේ හෝ යම් කිසි පුද්ගල කණ්ඩායමක ශාස්ත්‍රීය නොවන මතවාදයක් සනාථ කිරීමේ හෝ වෙනත් ස්වායත්ත අපේක්ෂාවන්ගෙන් යුක්තව පක්ෂග්‍රාහී නැඹුරුවකින් යුත් මාතෘකා තෝරා ගැනීම ද හිතකර නොවේ. මීට අමතරව තෝරා ගන්නා ලද මාතෘකාව සමාජ උන්නතියට වඩා සමාජ අවනතියට හේතු වන්නේ නම්, පවතින පොදු නීතියට අභියෝග වන්නේ නම් සහ එම මාතෘකාව මත සිදු කරන පර්යේෂණය කවරාකාරයක හෝ හානිදායක පර්යේෂණයක් වන්නේ නම් එවැනි මාතෘකා තෝරා ගැනීම සදාචාර සම්පන්න නොවේ (Cavan,1977:810). එසේම කිසියම් පර්යේෂකයෙක් සිය පර්යේෂණ මාතෘකාව වඩාත් නිවැරදි සාධාරණ යුක්තිගරුක තත්වයට පත් කිරීම සම්බන්ධව පහත සඳහන් කරුණු කෙරෙහිද සැලකිලිමත් වීම වැදගත් වේ.

1. පර්යේෂණ මාතෘකාව /ගැටලුව කිසිවෙකුට හානියක් නොවන සමාජ විරෝධී එකක් නොවීම.
2. තමාගේ පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ හා අත්දැකීම් සම්භාරයට ගැළපෙන පර්යේෂණ මාතෘකාවක් වීම.
3. ගැටලු සහගත තත්ත්වයක් උද්ගත වන පර්යේෂණ මාතෘකාවක් තෝරා නොගැනීම. (උදා : ආගමික විශ්වාස අභියෝගයට ලක් වන මාතෘකා)
4. පර්යේෂණ මාතෘකාව ජීවී සහ අජීවී පරිසර තත්ත්වයන්ට හානිකර නොවීම.
5. පර්යේෂණ මාතෘකාව තුළ සැබෑ නම් ගම් සඳහන් කිරීම.
6. මීට පෙර වෙනත් අය විසින් පර්යේෂණයට යොදාගෙන ඇති මාතෘකාවක් නොවීම.

7. පර්යේෂණ උපදේශකවරයාගේ උපදෙස් නොතකා මාතෘකාව හිතාමතා වෙනස් නොකිරීම.
8. අනුමත කරන ලද පර්යේෂණ මාතෘකාවම පර්යේෂණයෙහි සඳහන් කිරීම.
9. රටේ පවතින පොදු සිවිල් නීතියට පටහැනි මාතෘකාවක් තෝරා නොගැනීම.
10. පර්යේෂණ පත්‍රිකාව කියවන්නාට සාධාරණයක් ඉටු කළ හැකි මාතෘකාවක් වීම (Maxwell, 2005: 234).

මේ අනුව පර්යේෂණ මාතෘකාවක් තෝරා ගැනීමේ දී ආචාරධර්ම ආරක්ෂා කිරීම පර්යේෂණයේ ගුණාත්මක බව කෙරෙහි හේතු සාධක වන බව පෙනී යයි. එම නිසා කවර ක්ෂේත්‍රයක් ඔස්සේ මාතෘකාවක් තෝරා ගත්ත ද එහි ආචාර ධර්මීය පදනම විමසා බැලීම වැදගත් අවශ්‍යතාවකි.

## 03. පර්යේෂණ කාර්යය අතරතුර අනුගමනය කළ යුතු ආචාරධර්ම

මාතෘකාවක් තෝරා ගැනීමෙන් පමණක් ආචාරධර්ම ආරක්ෂා කිරීම කෙරෙහි වන පර්යේෂකයාගේ වගකීම අවසන් නොවේ. පර්යේෂණ ආචාරධර්ම පිළිබඳ අදහස් දක්වන පන්ච් (Punch" 2005) හේ (Hay, 2006), සෙයිබර් (Sieber,1998) බර්ග් (Berg:2001) ක්ලේ (Kvale, 2007) සහ පැටන් (Patton, 2002) යනාදී පර්යේෂකයින් පෙන්වා දෙන්නේ මෙම ආචාරධර්මවල බලපෑම හුදෙක් මාතෘකාවට පමණක් නොව දත්ත රැස් කිරීමේ සිට අවසානය දක්වා සියලුම කාර්යයන්ට ඍජු බලපෑමක් ඇති කරන බවය. එහිදී පර්යේෂණ ක්‍රියාවලියේ දි පර්යේෂණයට ලක්වන්නන් සහ දත්ත දායකයන් (පර්යේෂණයට භාජනය වන තැනැත්තන්) සමඟ ක්‍රියා කිරීමේ දි ආචාර ධර්ම සම්බන්ධව වැඩි අවධානයක් යොමු විය යුතුය.

ඇමරිකා මනෝවිද්‍යා සංගමය මගින් පර්යේෂණ කාර්යයේදි අනුමනය කළ යුතු පොදු ආචාර ධර්ම පහක් (05) දක්වා තිබේ. ඒ අතරින් පර්යේෂණයට භාජනය වන්නන් සහ දත්ත දායකයන් කෙරෙහි, පර්යේෂකයා කෙසේ ක්‍රියා කළ යුත්තේ ද යන්න පැහැදිලිව දක්වා තිබේ (APA 2000: 57).

ඒ අනුව පර්යේෂණයක් ආරම්භයේදී පර්යේෂකයා විසින් පහත සඳහන් කරුණු පිළිබඳව පර්යේෂණයට ලක්වන්නන් දත්තදායකයන් දැනුවත් කළ යුතුය.

1. පර්යේෂණයේ අරමුණු, ඒ සඳහා ගතවන කාලය, පර්යේෂණ පටිපාටිය, සහ පර්යේෂණයට සහභාගි වීමෙන් පසු ඇති විය හැකි තත්ත්වයන්,
2. පර්යේෂණය ආරම්භ කිරීමෙන් පසු ඕනෑම අවස්ථාවක පර්යේෂණයට සහභාගි වීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ඔවුන්ට ඇති බව,
3. පර්යේෂණයට සහභාගි වීමෙන් යම් අනාගත ප්‍රතිලාභයක් ලැබෙන්නේ නම් ඒ බව, (මෙහිදී කිසිදු ප්‍රතිලාභයක් හෝ වෙනයම් ප්‍රේරණයක් මගින් පුද්ගලයන් පර්යේෂණයට සහභාගි කර ගැනීම සදාචාර සම්පන්න නොවේ.)
4. රහස්‍යභාවය සම්බන්ධ බාධාවන් (දත්ත කේතනය කිරීමේදී, වාර්තා කිරීමේදී, සහ බෙදා හැරීමේදී රහස්‍ය තොරතුරු අනාවරණය වීමට ඉඩ ඇත්නම් ඒ පිළිබඳ පූර්ව දැනුවත් කිරීම් කළ යුතුය.)

මීට අමතරව පර්යේෂණයට ලක් වන්නන්ගේ අයිතීන් සහ හැඟීම් සෑමවිට ම ආරක්ෂා කළ යුතු අතර කිසිදු ආකාරයක මුළාවකට පත් නොකළ යුතුය. පර්යේෂණයට සහභාගිවන්නන් කෙරෙහි පර්යේෂකයා කෙසේ ක්‍රියා කළ යුත්තේදැයි නන්දසේන රත්නපාල මෙසේ පෙන්වා දෙයි. "කොයිම අවස්ථාවකදීවත් අපේ පර්යේෂණයන්ට භාජනය වන මිනිසුන් විද්‍යාඥයින්ගේ කූඩුවල හිරවුණ මීයන් නොවේ. මිනිස් හැඟීම් ඇති මිනිසුන්ය. අප මේ පර්යේෂණ කරන්නේ මිනිසුන් සඳහාමය. මිනිස්කම සහ හෘදය සාක්ෂිය යන දෙක අතර තුලනය ඇති කරගැනීම තරම් හොඳ උපක්‍රමයක් පර්යේෂණවල ආචාරධර්ම තීරණයේදී තවත් ඇතැයි මට නොසිතේ." (1995: 81). ඒ අනුව පර්යේෂණයක් ක්‍රියාත්මක කිරීමේදී සහභාගිවන්නන්ගේ කායික, මානසික, සමාජමය, වෘත්තීය සහ ආර්ථික ස්ථාවරත්වයට සහ කීර්තියට හානි නොවීමට වග බලා ගැනීම පර්යේෂකයාගේ යුතුකමකි.

පර්යේෂණයක් සඳහා යම්කිසි පුද්ගලයෙකු හෝ පුද්ගල කණ්ඩායමක් නියැදිය ලෙස තෝරාගන්නේ නම්, ඒ සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන පිරිසක් තෝරා ගත යුතුය. පර්යේෂණ කාර්යයේ දි කිසිදු අයුරකින්, කිසිදු පුද්ගලයෙකුහට ප්‍රතිලාභ ලබාදීම්, අල්ලස් ලබාදීම්, තර්ජනය කිරීම් හෝ සාවද්‍ය මගපෙන්වීම් මගින් ඔවුන් පොළඹවා නොගත යුතුය.

පර්යේෂණයට සහභාගී වන පුද්ගල කණ්ඩායම එකී පර්යේෂණ ක්‍රියාවලිය පිළිබඳව වටහා ගත නොහැකි (කුඩා ළමුන්, මානසික රෝගීන්) තත්ත්වයේ පසු වන අවස්ථාවක, ඔවුන්ගේ භාරකරුවන් හෝ අදාළ වගකිවයුතු ආයතනවල අනුමැතිය ලබා ගැනීම අත්‍යවශ්‍යය (Gerald P. Koocher, 1998: 145). මෙහිදී පර්යේෂකයාගේ නියැදිය කුඩා දරුවන් වන අවස්ථාවකදී, භාරකරුවන්ගේ අවසරය ලබා ගැනීම අත්‍යවශ්‍ය වන අතර, (ලිඛිත අවසරය ලබා ගැනීම වඩා උචිතය) දත්ත රැස්කිරීමේදි දරුවන්ගේ මට්ටමට ගැළපෙන උපකරණ හා පර්යේෂණ ප්‍රශ්න භාවිත කළ යුතුය.

මීට අමතරව දත්ත රැස් කිරීමේදි ආචාරධර්මවලට පටහැනි විය හැකි අවස්ථා රාශියක් ජෙනිෆර් පීට් විසින් පෙන්වා දී ඇත (Peat J, 2001: 51).

1. වැඩිහිටියන් උත්තර ලබා දිය යුතු පර්යේෂණ ප්‍රශ්නවලට කුඩා ළමුන් හෝ වරප්‍රසාද නොළත් පුද්ගලයින් භාවිත කිරීම.
2. ප්‍රමාණවත් පාලන කණ්ඩායමක් නොමැතිව සම්පරීක්ෂණ පැවැත්වීම.
3. පර්යේෂණ සැලසුමෙන් පරිබාහිර අංශ පිළිබඳ කරුණු එකතු කිරීම.
4. සංඛ්‍යා විද්‍යාත්මක බලයක් නොමැති කුඩා නියැදියක් පර්යේෂණය සඳහා භාවිත කිරීම.
5. අධ්‍යයන නියැදිය තෝරා ගැනීමට පෙරතුව අධ්‍යයනය ආරම්භ කිරීම.
6. එකතු කළ තොරතුරු විග්‍රහ නොකිරීම සහ එම තොරතුරු මහජන ප්‍රදර්ශනය සඳහා ප්‍රසිද්ධ නොකිරීම.

## රහස්‍යභාවය (Confidentiality and Privacy)

පර්යේෂණයට සහභාගි වන පුද්ගලයන්ගේ රහස්‍යභාවය සහ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම යනු ඕනෑම වර්ගයක පර්යේෂණයක මූලික ශික්ෂාවයි (Sales, B.D. & Folkman, S.2000: 76). මෙහිදී පර්යේෂකයාගේ විමර්ශන පරාසය තුළ තමන්ට අවශ්‍ය සහ හෙළි කිරීමට කැමති තොරතුරු පමණක් ඉදිරිපත් කිරීමටත්, කැමති තොරතුරු හෙළි නොකර සිටීමටත් දත්ත දායකයාගේ ඇති අයිතිය තහවුරු විය යුතුය. ඕනෑම වර්ගයක පර්යේෂණයක දී සම්ප්‍රදාය වන්නේ, පුද්ගල අනන්‍යතාව හෙළි නොවන පරිදි දත්ත එක් රැස් කිරීමයි. එබැවින් දත්ත දායකයාගේ පෞද්ගලික තොරතුරු සහ අනන්‍යතාව හෙළි නොකළ යුතුය.

පර්යේෂණ කාර්යයේදී දත්ත එක්රැස් කරගැනීම සඳහා සහභාගි වන්නන් සමග පර්යේෂණ කාර්යයට අමතර සබඳතා ඇති නොකරගැනීමට ද පර්යේෂකයා වග බලා ගත යුතුය. අදාළ පර්යේෂණය සඳහා වන පර්යේෂණ ක්‍රියාවලියේ ඒ ඒ පටිපාටිවලට අදාළව පවතින නීති රෙගුලාසි පිළිබඳවද සැලකිලිමත් විය යුතුය. උදාහරණ ලෙස ඇතැම් පර්යේෂණවලදී දත්ත රැස්කිරීම සඳහා සුදුසුකම් සහිත පර්යේෂකයන්ට (වෛද්‍යවරුන්, සහතිකලත් උපදේශකයන්) පමණක් අවසර ලැබෙන අවස්ථා ඇත. රාජ්‍ය හා පෞද්ගලික තොරතුරු රැස් කිරීමේදී (අවශ්‍යතාව හා අවසරය මත) හා කේතනය කිරීමේදී එම තොරතුරු බාහිර පාර්ශවයක් අතට පත් වීම හෝ නිරීක්ෂණය වීමට ඇති ඉඩ ඇහිරිය යුතුය.

රැස්කරන ලද දත්ත, වෙනත් පර්යේෂකයන් හෝ පර්යේෂණ කණ්ඩායමක් අතර හුවමාරු වන්නේ නම්, ඒ පිළිබඳව දත්ත රැස් කිරීමට පෙර දත්තදායකයා දැනුවත් කර තිබිය යුතුය. රහස්‍යභාවය ආරක්ෂා කිරීමට අදාළව අවංකභාවය, බුද්ධිමය දේපලවලට ගරු කිරීම, පරෙස්සම් සහගත බව සහ සමාජමය වගකීම යනාදී සාධක පිළිබඳවද පර්යේෂකයා සිය අවධානය යොමු කළ යුතුය (Sales, B.D., Folkman, S.2000 76:1).

**අවංකභාවය (Honesty)**

පරිපූර්ණ පර්යේෂණයක් යනු විද්‍යාත්මක ක්‍රමවේද මත ගොඩ නැගුණු සත්‍ය ක්‍රියාවලියක් විය යුතුය. එහිදී දත්ත රැස් කිරීම, දත්ත වාර්තා කිරීම, නිවැරදි ක්‍රමවේද භාවිතය ආදි සෑම ක්‍රියාවලියකදී ම පර්යේෂකයා තම අනන්‍යතාව හා අවංකභාවය ආරක්ෂා කර ගත යුතුය (Resnik, J.D. 2015: 27). වැරදි දත්ත ඉදිරිපත් කිරීම (Fabricated Data) සහ වැරදි දත්ත අර්ථ කථනය කිසිසේත් නොකළ යුතුය. පර්යේෂණයේ අවසන් වාර්තාව සියයට සියයක්ම නිවැරදි දත්ත මත පදනම් විය යුතු අතර ලේඛන චෞරත්වයෙන් බැහැර විය යුතුය. පෙර සඳහන් කළ පරිදි පර්යේෂණයට උපකාර කරන්නන්, ආධාර අනුබල සපයන්නන්, දත්ත දායකයන් සහ මහජනතාව කුමන හේතුවක් මත හෝ පර්යේෂණය මගින් මුලාවට පත් නොකළ යුතුය.

**පරෙස්සම් සහගත බව (Carefulness)**

පර්යේෂකයා විසින් නොසැලකිලිමත්භාවය නිසා ඇති විය හැකි, ගැටලු හා දෝෂ පිළිබඳ දැඩි අවධානයෙන් සිටිය යුතුය. පර්යේෂණ සැලැස්ම, රැස් කරනු ලබන දත්ත ආදි බොහෝ දේ වාර්තා කිරීමේ දී ඉතා සැලකිලිමත් විය යුතුය. එහිදී දත්ත අවභාවිත කිරීමෙන් වැලකීම පර්යේෂකයාගේ වගකීමකි. දත්ත අවභාවිතය යනු, දත්ත වැරදි ලෙස භාවිත කිරීමයි. එනම්, කිසියම් අරමුණක් උදෙසා විද්‍යාත්මක ක්‍රමවේදයන්ට අනුකූලව රැස් කරගනු ලබන්නා වූ දත්ත වැරදි ලෙස භාවිත කිරීම දත්ත අවභාවිත කිරීමයි (සිද්ධිසේන, 1997: 17).

**සමාජීය වගකීම (Social Responsibility)**

කවර ක්ෂේත්‍රයකදි වුව ද පර්යේෂකයාගේ අවසාන වගකීම පවතින්නේ සමාජය කෙරෙහිය. එබැවින්, පර්යේෂණ ක්‍රියාවලිය මගින්, සමාජ හර පද්ධති, පවතින සමාජ දැනුම, පිළිගැනීම් අවතක්සේරු නොකළ යුතුය. ජන විඥානය පිළිබඳ සංවේදී කරුණු ගවේෂණය වන පර්යේෂණවලදී ඉතා පරිස්සම් සහගත විය යුතුය.

## බුද්ධිමය දේපලවලට ගරු කිරීම (Respect for Intellectual Property)

ප්‍රකාශිත හෝ අප්‍රකාශිත පූර්ව පර්යේෂණ ආශ්‍රිත දත්ත, ප්‍රතිඵල, වාර්තා සහ අදහස් උපුටා ගැනීමේදී ඒ සඳහා වන සාහිත්‍යමය හා පර්යේෂණ මූලධර්ම අනුගමනය කළ යුතුය. එවැනි උපුටා ගැනීමක් සිදු කිරීමේදී සහ සෑම ආකාරයක ම පර්යේෂණ සහයෝගය ස්තුති පූර්වකව සඳහන් කළ යුතුය. ලේඛන චෞරත්වය බැහැර කළ යුතුය. "ලේඛන චෞරත්වය (Plagarism) යනු වෙනත් පර්යේෂකයෙකුගේ හෝ ලේඛකයෙකුගේ ලේඛනයක් ද සම්පූර්ණයෙන්ම හෝ එහි කොටසක්, අදහසක් ඒ අයුරින්ම තමන් උපයන ලද දැනුම් කොටසක් සේ හුවා දැක්වීමයි" (Conners , 1996: 46).

## වර්ගවාදී බව බැහැර කිරීම (Non-Discrimination)

පර්යේෂණ කාර්යයේ දී ජාතිය, වර්ගය, ආගම, ලිංගිකත්වය ආදී සියලුම ආකාරයේ වර්ගවාදී ආකල්ප, අදහස් හා ක්‍රියාත්මක වීම් සිදු නොවිය යුතුය.

## වටිනා සංස්කෘතිකාංග ආරක්ෂා කිරීම ( Security of Cultural Values)

පර්යේෂණ ක්‍රියාවලියේදී ඇතැම්විට සංස්කෘතික, ජාතික හෝ පුරාවිද්‍යාත්මක වටිනාකම්වලින් යුත් සංස්කෘතිකාංග සහ වස්තු පිළිබඳ අධ්‍යයනය කිරීමට සිදු වෙයි. එවැනි අවස්ථාවලදි එම වටිනාකම්වලට හානි නොවන හා ඒවා විකෘති නොවන අයුරින් පර්යේෂණ කාර්යයයේ නිරත විය යුතුය.

## සත්ව හිංසාව බැහැර කිරීම ( Animal Care)

පර්යේෂණය සඳහා යම් ආකාරයක සතුන් භාවිත කිරීමකදී සත්ව හිංසාවක් සිදු නොවිය යුතු අතර නිසි ආරක්ෂිත වැඩ පිළිවෙළක් නොමැතිව සතුන් ආශ්‍රිත පර්යේෂණ සිදු නොකළ යුතුය (Ransohoff, Med, 2018).

### 04. පර්යේෂණ කාර්යය නිම කිරීමෙන් අනතුරුව සලකා බැලිය යුතු ආචාර ධර්ම

පර්යේෂණ ක්‍රියාවලියක වැදගත්ම අරමුණක් වන්නේ එමගින් සොයා ගන්නා ලද නව දැනුම සමාජගත කිරීමයි. පර්යේෂණ දත්ත, ප්‍රතිඵල සහ දැනුම බෙදා ගැනීමට ඇති කැමැත්ත මෙහිලා අගය කෙරේ. කෙසේ වෙතත් පර්යේෂණයක් ප්‍රකාශනය කිරීම ආශ්‍රිතව ද ආචාර ධර්ම ගණනාවක් හඳුන්වා දී තිබේ.

පර්යේෂණය මගින් ප්‍රසිද්ධ කරන තොරතුරු නිවැරදිව ඉදිරපත් කිරීම එක් ආචාර ධර්මයකි. තොරතුරු වෙනස්කිරීම, එකතු කිරීම හා ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කිරීම ආචාර ධර්ම විරෝධි වෙයි. පර්යේෂණ තොරතුරු ඉදිරිපත් කරන සම්මන්ත්‍රණ, විද්‍යාත්මක සඟරා, පොත් හෝ පර්යේෂණ වාර්තා හරහා අදාළ තොරතුරු දසදහස් ගණනකගේ විමසිල්ලට ලක් වේ. එහි ව්‍යාජ තොරතුරු අඩංගු වී තිබුණහොත් පර්යේෂකයා විද්‍යාත්මක අනාචාරයට ලක් වේ (පිනිකහන, 2010: 200).

එමෙන් ම එක ම පර්යේෂණ පත්‍රිකාවක් පර්යේෂණ සඟරා දෙකක පළ කිරීම ආචාර ධර්මවලට එකග නොවන බව පිළිගැනීමයි. කෙසේවෙතත් යම් හේතුවක් මත එසේ පළ කිරීමට සිදුවන්නේ නම් අවම වශයෙන් ප්‍රකාශකයන් දෙදෙනා ම ඒ පිළිබඳව දැනුවත් කිරීම හෝ සිදු විය යුතුය.

පර්යේෂණය ප්‍රකාශනයට පත් කිරීමෙන් පසුව වුව ද ඒ සම්බන්ධ ව පර්යේෂකයාගේ ආචාර ධර්මීය වගකීම අවසන් නොවේ. තමන් විසින් ඉදිරිපත් කරන ලද නව දැනුම සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම පර්යේෂකයා දැරිය යුතු අතර පර්යේෂණයට අදාළ බාහිර පාර්ශ්වයන්ට නව අදහස් හා විවේචනවලට ද ඉඩ ලබා දිය යුතුය. මෙහිලා පර්යේෂණය සඳහා එක්රැස් කරන ලද දත්ත වසර පහක පමණ කාලයක් සුරක්ෂිතව තබා ගැනීම සුදුසු වේ. යම් හෙයකින් පර්යේෂණයේ විශ්වසනීයත්වය තහවුරු කිරීමට අවශ්‍ය වුවහොත් එම දත්ත සුරක්ෂිත කර තිබීම පහසුවක් වනු ඇත.

පර්යේෂණය අවසන් කිරීමෙන් පසු පර්යේෂණ වාර්තාව සහ ඒ ආශ්‍රිත දැනුම පමණක් නොව පර්යේෂණ දත්ත අදාළ පාර්ශ්ව සහ වෙනත් පර්යේෂකයන්ට ලබාදීම ද පර්යේෂණ ආචාර ධර්මයක් සේ සැලකේ. කෙසේ වෙතත් එහිදී පර්යේෂණයට අදාළ රහස්‍ය තොරතුරු පිළිබඳ වගකීම සිහිතබා කටයුතු කළ යුතුය.

## සමාලෝචනය

ඕනෑම පර්යේෂණයක මුඛ්‍ය පරමාර්ථය විය යුත්තේ සමාජ සුබ සිද්ධියයි. එබැවින් පර්යේෂණ කාර්යයේදී පර්යේෂණ ආචාර ධර්ම පිළිපැදීම පර්යේෂකයාගේ වගකීමයි. එමගින් පවතින නීතිරීති, සමාජ ආචාර ධර්ම සහ විවිධ පුද්ගල අයිතිවාසිකම් ආරක්ෂාවීම සිදු වේ. පර්යේෂණයක් සිදු කිරීමේදී පර්යේෂණ ආචාර ධර්මවලට අනුව ක්‍රියාකිරීමෙන් අදාළ පර්යේෂණයේ විශ්වසනීයත්වය සහ පර්යේෂණයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීමට හැකි වන අතර පර්යේෂණය සඳහා අවශ්‍ය මහජන දායකත්වය පහසුවෙන් ලබා ගැනීමට ද හැකි වේ. මේ අනුව පර්යේෂණයට සුදුසු මාතෘකාවක් තෝරා ගැනීමේ කාර්යයේ සිට පර්යේෂණ පත්‍රිකාව ප්‍රකාශනයට පත්කිරීම දක්වා මෙන් ම ඉන් පසුව ද ආචාර ධර්ම ආරක්ෂා කළ යුතු බවත්, එය පර්යේෂණයේ සාඵල්‍ය කෙරෙහි අත්‍යවශ්‍ය වූවක් බවත් මෙනයින් ගම්‍ය වේ.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

පිනිකහන, ජේ. (2012). **සමාජ පර්යේෂණ ක්‍රම**, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

රත්නපාල, නන්දසේන (1995). **සමාජ විද්‍යා පර්යේෂණ මූලධර්ම**, වරකාපොල: ආරිය ප්‍රකාශකයෝ, බෞද්ධ විද්‍යාල මාවත.

සිද්ධිසේන, කේ. ඒ. පී. (1997). **දත්ත විශ්ලේෂණ ප්‍රවේශය**, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

සේනාධීර සිල්වි, සහ වනසිංහ ශාමින්ද (2014). **පර්යේෂණ ක්‍රමවේදය**, කොළඹ 10: ඇස් ගොඩගේ සහෝදරයෝ.

Caven,S.(1977) Review of J.D.Douglas's(1976) **Investigative social Review**: Individual and Team Field Research The American Journal of Sociology.

Conners M. Cybercheating: (1998). **The Internet Could Become the Newest Battleground in Academic Fraud**. The Muse. 1996. **Ethical Principles of Psychologists and Code of Conduct**. (2002).American Psychologist.American Psychological Association.

David B. Resnik, J.D., Ph.D.December 1, (2015). **The Ideas and Opinions Expressed in this Essay are the Author's Own and do not Necessarily Represent those of the NIH**, NIEHS: or US government.

Hesse-Bibber.Sov,& Leavy,P. (2006). **The Picture of Qualitative Research**.Thousnd oaks,CA: Saga.

Gerald P. Koocher, PhD, (1998). **Ethics in Psychology: Professional Standards and Cases**" Oxford University Press.

Maxwell, J.A (2005). **Gualitative Research Design**: SAGA: An interactive approach( 2nd ed.) Thousend Oaks,C.A:Sage

Sales B.D., & Folkman, S. (Eds.). (2000). **Ethics in Research with Human Participants**. Washington, DC: American Psychological Association.

https://en.wikipedia.org/wiki/educational research. All (animal models (of neurodegeneration) are wrong. Are they also useful? Richard M. Ransohoff, J Exp Med, 2018.The National Institutes of Health (NIH) offers an online. tutorial, "Human Participants Protections Education for Research Teams," from http://cme.nci.nih.gov.